# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/08/2021-VI
ඔබේ අංකය / உமது இல / Your No: ..............................................
දිනය / திகதி / Date: 2021.03.23

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන්,

**<u>සමෘද්ධි බැංකු වල බොල් ණය කරුවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම.</u>**

සමෘද්ධි බැංකු මගින් කුඩා කණ්ඩායම් ඇප මත විවිධ ණය වැඩසටහන් යටතේ ප්‍රදානය කල ණය මුදල් අතරින් සමහර ණය කරුවන් ණය ගෙවීම පැහැර හැර ඇති අතර, පසුව එම ණය බොල් ණය ලෙස හඳුනාගෙන වෙනම සටහන් කර ඇත.

02. මෙම බොල් ණය මුදල් ආපසු අය කර ගැනීමට සමෘද්ධි බැංකු මගින් විවිධ ක්‍රියාමාර්ග ගෙන ණය ආපසු අය කර ගැනීමට කටයුතු කර ඇතත්, සමහර බොල් ණය කරුවන් මෙතෙක් ණය ගෙවීම සිදු කර නැත.

03. මෙම බොල් ණය මුදල් ද ආපසු අය කරගැනීම තුලින් සමෘද්ධි බැංකුවේ ලාභදායිත්වය හා මූල්‍ය වත්කම් ඉහළ නංවා ගත හැකි අතර, කුඩා කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන්ට ද ණය ලබාගැනීමට හැකියාව ලැබේ. එබැවින් මෙම ණය මුදල් අය කරගැනීමට වැඩපිළිවෙලක් සකස් කරගැනීම සඳහා මෙම තොරතුරු රැස් කිරීමට අපේක්ෂා කර ඇත.

04. එබැවින් කුඩා කණ්ඩයාම් ඇප මත ණය මුදල් ලබාගෙන පසුව ණය ගෙවීම පැහැර හැර ඇති බොල් ණය කරුවන් පිළිබඳ තොරතුරු කාල සීමාවන් 03 ක් අනුව වෙන් කර ලබාගැනීමට පහත උපදෙස් පරිදි මෙම ලිපිය සමග ඇමුණුම 01, 02 සහ 03 නිවැරදිව සම්පූර්ණ කර 2021.03.31 දිනට පෙර sbankinfo@gmail.com විද්‍යුත් ලිපිනයට එවිය යුතුය.

i. 2010.12.31 වන දින හෝ ඊට පෙර බොල් ණය ලෙස හඳුනාගත් ණය කරුවන් පිළිබඳ ලේඛනය.**(ඇමුණුම 01)**
ii. 2011.01.01 වන දින සිට 2015.12.31 දින දක්වා බොල් ණය ලෙස හඳුනාගත් ණය කරුවන් පිළිබඳ ලේඛනය. **(ඇමුණුම 02)**
iii. 2016.01.01 වන දින සිට 2020.12.31 දින දක්වා බොල් ණය ලෙස හඳුනාගත් ණය කරුවන් පිළිබඳ ලේඛනය. **(ඇමුණුම 03)**
iv. බොල් ණය කරුවන්ගේ දැනට තත්ත්වය නිවැරදි ලෙස දැක්විය යුතුය.
v. ණය මුදල ආපසු ගෙවීමට ඉල්ලා සිටින සහනය කුමක්ද යන්න පැහැදිළිව දැක්විය යුතුය. මෙම සහනය නොදක්වා ඇත්නම් ඒ පිළිබඳව නොසලකා කටයුතු කරන බව දන්වමු.
vi. 2020.12.31 දිනට අය විය යුතු මුළු පොලී මුදල් සහ දඩ පොලිය වෙන වෙනම අගයන් සටහන් කල යුතුය.
vii. ණය මුදල ගෙවීම පැහැර හැරි දින සිට 2020.12.31 දින දක්වා බොල් ණය වූ කාලය මාස වලින් සටහන් කල යුතුය.
viii. බොල් ණය කරු මෙන්ම කලත්‍රයාද මිය යාම හෝ පූර්ණ දුබලතාවයට පත් වී ඇති අවස්ථාවක ණය මුදල ආපසු ගෙවීමට දරුවන්/ඥාතීන් නොමැති විටක පමණක් ණය සංරක්ෂණ ප්‍රතිලාභ ඉල්ලා සිටීමට ඉඩ දෙනු ලැබේ.

එස්.ඒ.එස්.වික්‍රමසිංහ
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) වැ.ආ
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත් :- 01. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස හා අ.ක.ස.
02. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස. හා අ.ක.ස.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් பணிப்பாளர் தலைமையதிபதி Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී பிரதான கணக்காளர் Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) பணிப்பாளர் (குறு நிதி ) Director ( Micro Finance) | කාර්යාලය அலுவலகம் Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

03. නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස හා අ.ක.ස.